# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2126/36 - 2019 ජූනි මස 05 වැනි බදාදා - 2019.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81(VIII)

### 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 23එ, 23ඒ සහ 23ඔ වගන්ති යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 ජූනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2019 අංක 01 දරන ජාතික පාරිසරික (ස්ථානීය ප්‍රභව විමෝචන පාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝගවල I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති සහ දුම්නල විමෝචන පිටකරනු ලබන, යම් ස්ථානීය විමෝචන ප්‍රභවයක් කළමනාකරණය කරනු ලබන හෝ පාලනය කරනු ලබන යම් පුද්ගලයෙකු විසින්, එම ස්ථානීය විමෝචන ප්‍රභවය, මේ නියෝගවල II වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ස්ථානීය ප්‍රභව විමෝචන පාලන ප්‍රමිතිවලට අනුකූල වන ලෙස ඉදි කළ යුතුය.

3. මෙම නියෝගවල I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා නොමැති සියලුම ස්ථානීය විමෝචන ප්‍රභව මගින් පිටකරනු ලබන විමෝචන, මේ නියෝගවල III වන උපලේඛනයෙහි I වන සහ II වන කොටස් වල නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය.

4. යම් කර්මාන්ත ක්‍රියාවලියකින් මුදාහරිනු ලබන සියලුම පලායිත වායු විමෝචන (fugitive emissions), මේ නියෝග වල අංක IV, V, VI සහ VII වන උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති ක්‍රමවේද සහ ප්‍රමිති භාවිතා කර මැනීම සහ පාලනය කිරීම කළ යුතු ය.

5. විමෝචනයන් මැනීම සඳහා (මෙහි මින් මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත මිනුම් ක්‍රම භාවිත කළ යුතු ය.



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

6. මනින ලද යම් ස්ථානීය ප්‍රභව විමෝචන සාන්ද්‍රණයක් වියළි තත්ත්වයන්ට අනුරූප වන ලෙස පරිවර්තනය කළ යුතු ය. එසේ පරිවර්තනය කිරීම සඳහා පහත සඳහන් සමීකරණය භාවිත කළ යුතු ය.

$$\text{වියළි තත්ත්වයන්ට අනුරූප විමෝචන සාන්ද්‍රණය} = \frac{(\text{මනින ලද විමෝචන සාන්ද්‍රණය})}{[100 - (\text{විමෝචනයේ ජල වාෂ්ප ප්‍රතිශතය})]} \times 100$$

7. 6 වන නියෝගය යටතේ වියළි තත්ත්වයන්ට අනුරූප වන ලෙස පරිවර්තනය කළ ස්ථානීය ප්‍රභව විමෝචන සාන්ද්‍රණය සම්මත තත්ත්වයන්ට අනුරූප වන ලෙස පරිවර්තනය කළ යුතු ය. එසේ පරිවර්තනය කිරීම සඳහා පහත සඳහන් සමීකරණය භාවිත කළ යුතු ය.

$$C_n\,(mg/Nm^3) = C_s\,(mg/m^3) \times \frac{(P_n \cdot T_s)}{(P_s \cdot T_n)}$$

මෙම සමීකරණයෙහි $C_n$= සම්මත උෂ්ණත්ව සහ සම්මත පීඩන තත්ත්වයන්ට අනුරූප සාන්ද්‍රණය

$C_s$= වියළි තත්ත්වයට පරිවර්තනය කරන ලද විමෝචන සාන්ද්‍රණය

$P_n$= සම්මත පීඩනය රසදිය මිලි මීටර 760

$P_s$= දුම්නලයේ පීඩනය රසදිය මිලි මීටර

$T_n$= සම්මත උෂ්ණත්වය 273 කෙල්වින්

$T_s$= දුම්නලයේ උෂ්ණත්වය කෙල්වින්

8. 7 වන නියෝගය යටතේ සම්මත තත්ත්වයන්ට අනුරූප වන ලෙස පරිවර්තනය කරන ලද ස්ථානීය ප්‍රභව විමෝචන සාන්ද්‍රණය VIII වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සම්මත ඔක්සිජන් ප්‍රතිශතවලට අනුරූප වන ලෙස පරිවර්තනය කළ යුතු ය. එසේ පරිවර්තනය කිරීම සඳහා පහත සඳහන් සමීකරණය භාවිත කළ යුතු යः-

$$E_r\,(mg/Nm^3) = E_m(mg/Nm^3)\left[\frac{20.9 - O_2\%ref}{20.9 - O_2\%m}\right]$$

මෙම සමීකරණයෙහි $E_r$ = ඉන්ධන වර්ගයට අදාළ සම්මත ඔක්සිජන් ප්‍රතිශතයට අනුරූප විමෝචන සාන්ද්‍රණය

$E_m$ = සම්මත තත්ත්වයන්ට අනුරූප විමෝචන සාන්ද්‍රණය

$O_2\%ref$ = VIII වන උපලේඛනයෙහි දක්වා ඇති ඉන්ධන වර්ගයට අදාළ ඔක්සිජන් ප්‍රතිශතය

$O_2\%m$ = වියළි තත්ත්වයන්ට පරිවර්තනය කළ දුම්නලයේ ඔක්සිජන් ප්‍රතිශතය

9. VIII වන උපලේඛනයේ ඉන්ධන වර්ගය නිශ්චිතව සඳහන් කොට නැති අවස්ථාවල දී, සම්මත ඔක්සිජන් ප්‍රතිශතය සියයට හයක් (6%) විය යුතු ය. එසේ වුව ද, මිශ්‍ර ඉන්ධන භාවිත කරන අවස්ථාවල දී, ආදාන තාප ප්‍රමාණය පදනම් කර ගනිමින් නිර්ණය කළ ප්‍රධාන ඉන්ධන වර්ගය ඒ සඳහා යොදා ගත යුතු ය. ඕනෑම දහනාගාරයක් (incinerator) සඳහා සම්මත ඔක්සිජන් ප්‍රමාණය සියයට දහයක් (10%) ලෙස ගත යුතු ය.

10. බහු ඉන්ධන භාවිතයේ දී, මේ නියෝගවල II වන උපලේඛනයේ එක් එක් ඉන්ධන වර්ගය සඳහා නිශ්චිතව දක්වා ඇති ප්‍රමිති අදාළ විය යුතු ය.

11. ඕනෑම ලක්ෂිය දාහක ප්‍රභවයක් (combustion point source) සඳහා අවම දුම්නල උස පහත සඳහන් සමීකරණය භාවිතයෙන් ගණනය කළ යුතු ය.

$$C(m) = H\,(m) + 0.6\,U\,(m)$$

මෙම සමීකරණයෙහි H = දුම්නලයේ සිට අරය $5U$ දුරක් ඇතුළත පිහිටි උසම ගොඩනැගිල්ලේ උස මීටර්වලින්

C = අවම දුම්නල උස මීටර් වලින්

U = නිවැරදි නොකරන ලද දුම්නල උස මීටර් වලින්

U පහත සඳහන් සමීකරණය භාවිතයෙන් ගණනය කළ යුතු ය.

$$U(m)=1.36Q^{0.6}$$

මෙම සමීකරණයෙහි Q = සැපයෙන දළ ආදාන තාප ප්‍රමාණය මෙගාවොට් වලින් (gross heat input in MW)

(i) මෙම රීතිය දළ ආදාන තාප ප්‍රමාණය 0.620 MW ට වඩා වැඩි දාහක ප්‍රභව සඳහා යොදා ගත යුතු ය.

(ii) දළ ආදාන තාප ප්‍රමාණය 0.620 MW ට වඩා අඩු දාහක ප්‍රභවවලට හැර, කවර අවස්ථාවක දී වුව ද දුම්නලයක උස මීටර 20 කට අඩු නොවිය යුතු ය.

12. තාප විදුලි බලාගාර සහ වෙනත් දාහක ප්‍රභවයන්ගෙන් පිටකරන සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) විමෝචන මඟින් සිදුවන වායු දූෂණය පාලනය, ඉන්ධනවල ගුණාත්මකභාවය, දුම්නල උස හෝ සල්ෆර් ඩයොක්සයිඩ් විමෝචන පාලන උපක්‍රම (devices) මඟින් පාලනය කළ යුතු අතර පවත්නා සංසරණ වායු තත්ව ප්‍රමිතීන් තුළ පවත්වා ගත යුතු ය. ඒ සඳහා අවශ්‍ය අවම දුම්නල උස පිළිගත් වායු තත්ත්ව මෘදුකාංගයක් (Acceptable Air Quality Modeling Software) භාවිතයෙන් නිර්ණය කළ යුතු ය. එසේ පිළිගත් වායු තත්ත්ව මෘදුකාංගයක් නොමැති අවස්ථාවක දී මධ්‍යම පරිසර අධිකාරියේ අනුමතය සහිතව පහත සඳහන් සමීකරණය භාවිතයෙන් අවම දුම්නල උස මීටර් වලින් ගණනය කළ යුතු ය.

අවම දුම්නල උස $H\ (m) = 14Q^{0.25}$

මෙහි Q යනු දුම්නලයේ සල්ෆර්ඩයොක්සයිඩ් ($SO_2$) විමෝචන සීඝ්‍රතාවය පැයට කිලෝ ග්‍රෑම් වලිනි.

13. ආදාහනාගාරවලින් පිටවන විමෝචන, ආදාහනාගාර දුම්නල තුළ අන්තර්ගත කළ හැකි වායු විමෝචන පාලන උපක්‍රම භාවිත කොට පාලනය කළ යුතු ය.

14. දහනාගාර (Incinerators) වලින් පිටවන ඩයොක්සීන් සහ ෆියුරාන් ප්‍රමාණයන්, ද්විතීයික කුටීරයේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 1000 සහ 1250 අතර රඳවා තබා ගැනීම මගින් සහ ධාරණ කාලය තත්පර 2 - 3 අතර පවත්වා ගැනීම මගින් පාලනය කළ යුතු ය.

15. කිසිදු පුද්ගලයෙකු විසින් මෙම නියෝගවල III උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දූෂණකාරක ආශ්‍රිත විමෝචන සීමා ඉක්මවා බාහිර පරිසරයට කිසිදු දූෂණකාරකයක් විමෝචනය කිරීම හෝ මුදාහැරීම නොකළ යුතු ය.

16. ඉහත නියෝගවලට අනුකූල වන ලෙස ක්‍රියා කිරීමට අපොහොසත් වන යම් පුද්ගලයෙකු, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ වන වරදකට වරදකරු විය යුතු ය.

17. මෙම නියෝගවල -

''අධිකාරිය'' යනුවෙන් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ ;

''PM'' යනුවෙන් අංශුමය ද්‍රව්‍ය (Particulate Matter) අදහස් වේ ;

''ppm'' යනුවෙන් දසලක්ෂයකට කොටස් ප්‍රමාණය (parts per million) අදහස් වේ ;

''$Nm^3$'' යනුවෙන් සම්මත තත්ත්ව වන සෙල්සියස් අංශක 0 උෂ්ණත්වය සහ රසදිය මිලිමීටර් 760 පීඩන තත්ත්වයේ පවතින වායුව ඝන මීටරයක ප්‍රමාණයක් අදහස් වේ ;

''නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_X$)'' යනුවෙන් දුම්නලයක් තුළින් පිටකරන නයිට්‍රික් ඔක්සයිඩ් (NO) හා නයිට්‍රජන් ඩයොක්සයිඩ් ($NO_2$) වායුවෙන් සාන්ද්‍රණ වල එකතුව අදහස් වේ.

(2 වන නියෝගය)

## I වන උපලේඛනය

1. තාප විදුලි බලාගාර
2. පොරොත්තු විදුලි ජනක යන්ත්‍ර
3. බොයිලේරු
4. තාප ද්‍රව ඌෂ්මක
5. දහනාගාර
6. කියුපෝලා, ධාරා ඌෂ්මක, කෝක් උඳුන්, මූලික ඔක්සිජන් දාහක, ප්‍රේරක සහ විද්‍යුත් චාප දාහක
7. සිමෙන්ති පෝරණු

(2 වන නියෝගය)

# II වන උපලේඛනය

## උපකරණ/ආම්පන්න ආශ්‍රිත ප්‍රමිතීන්

### I කොටස

### තාප විදුලි බලාගාර

| *ඉන්ධන වර්ගය* | *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C)* | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* |
|---|---|---|---|
| ඛනිජ තෙල් | C<1 මෙගාවොට් | අංශුමය ද්‍රව්‍ය (PM), සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දූම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | I≤C<3 මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), | 12 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි ඉන්ධනවල ගුණාත්මක බව සහ දූම්නල උස මගින් පාලනය කළ යුතු ය. |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | හුමාල ටර්බයින සඳහා 650mg/Nm$^3$ |
| | | | වායු ටර්බයින/සංයුක්ත චක්‍ර ටර්බයින සඳහා 550mg/Nm$^3$ |
| | | | අභ්‍යන්තර දහන එන්ජින් සඳහා 850mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 200mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | 3≤C<25 මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), | 12 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි දූම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | හුමාල ටර්බයින සඳහා 600mg/Nm$^3$ |
| | | | වායු ටර්බයින/සංයුක්ත චක්‍ර ටර්බයින සඳහා 500mg/Nm$^3$ |
| | | | අභ්‍යන්තර දහන එන්ජින් සඳහා 850mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | 25≤C<100 මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), | 12 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි දූම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | හුමාල ටර්බයින සඳහා 550mg/Nm$^3$ |
| | | | වායු ටර්බයින/සංයුක්ත චක්‍ර ටර්බයින සඳහා 450mg/Nm$^3$ |
| | | | අභ්‍යන්තර දහන එන්ජින් සඳහා 700mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | C≥100 මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), | 1. නව බලාගාරවල පළමු මෙගාවොට් 500 සඳහා දිනකට මෙගාවොට් එකකට සල්ෆර් ඩයොක්සයිඩ් කිලෝ ග්‍රෑම් 28 ක හා දිනකට සල්ෆර් ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් 14 ක ($SO_2$/day) උපරිමයන්ට යටත්ව සහ වැඩිවන එක් මෙගාවොට් 1 ක් සඳහා දිනකට මෙගාවොට් එකකට සල්ෆර් ඩයොක්සයිඩ් කිලෝ ග්‍රෑම් 10 ක සීමාවට යටත්ව 850mg/Nm$^3$<br>2. දැනට පවතින බලාගාර සඳහා ඉන්ධනවල ගුණාත්මකභාවය මගින් පාලනය කළ යුතු ය. |

(2 වන නියෝගය)

## II වන උපලේඛනය (සම්බන්ධිතයි)

## උපකරණ/ආම්පන්න ආශ්‍රිත ප්‍රමිතීන්

## I කොටස

### තාප විදුලි බලාගාර

| ඉන්ධන වර්ගය | ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C) | දූෂණකාරක වර්ගය | විමෝචන සීමාවන් |
|---|---|---|---|
| ඛනිජ තෙල් | $C \geq 100$ මෙගාවොට් | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | හුමාල ටර්බයින සඳහා 500mg/Nm$^3$ |
| | | | වායු ටර්බයින/සංයුක්ත චක්‍ර ටර්බයින සඳහා 450mg/Nm$^3$ |
| | | | අභ්‍යන්තර දහන එන්ජින් සඳහා 650mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| ජෛව ඉන්ධන | $C<0.5$ මෙගාවොට් | අංශුමය ද්‍රව්‍ය (PM), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි දුම්නල උස මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 25% |
| | $0.5 \leq C<3$ මෙගාවොට් | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 500mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 250mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 25% |
| | $C \geq 3$ මෙගාවොට් | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 450mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 200mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| ගල් අඟුරු | $C<50$ මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | 1600mg/Nm$^3$ |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 750mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 200mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | $C \geq 50$ මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), | 1. නව බලාගාරවල පළමු මෙගාවොට් 500 සඳහා දිනකට මෙගාවොට් එකකට සල්ෆර් ඩයොක්සයිඩ් කිලෝ ග්‍රෑම් 50 ක හා දිනකට සල්ෆර් ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් 30 ක ($SO_2$/day) උපරිමයන්ට යටත්ව සහ වැඩිවන එක් මෙගාවොට් 1 ක් සඳහා දිනකට මෙගාවොට් එකකට සල්ෆර් ඩයොක්සයිඩ් කිලෝග්‍රෑම් 25 ක සීමාවට යටත්ව 850mg/Nm$^3$<br>2. දැනට පවතින බලාගාර සඳහා ඉන්ධනවල ගුණාත්මකභාවය මගින් පාලනය කළ යුතු ය. |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 650mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/Nm$^3$ |
| | | දුම | පාරාන්ධතාවය 15% |
| ස්වාභාවික වායු | $C<50$ මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | 75mg/Nm$^3$ |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | හුමාල ටර්බයින සඳහා 350mg/Nm$^3$ |
| | | | වායු ටර්බයින/සංයුක්ත චක්‍ර ටර්බයින සඳහා 250mg/Nm$^3$ |
| | | | අභ්‍යන්තර දහන එන්ජින් සඳහා 400mg/Nm$^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 100mg/Nm$^3$ |

(2 වන නියෝගය)

## II වන උපලේඛනය (සම්බන්ධිතයි)

### උපකරණ/ආම්පන්න ආශ්‍රිත ප්‍රමිතීන්

*I කොටස*

**තාප විදුලි බලාගාර**

| *ඉන්ධන වර්ගය* | *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C)* | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* |
|---|---|---|---|
| ස්වභාවික වායු | $C \geq 50$ මෙගාවොට් | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | 75mg/$Nm^3$ |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | හුමාල ටර්බයින සඳහා 300mg/$Nm^3$ |
| | | | වායු ටර්බයින/සංයුක්ත චක්‍ර ටර්බයින සඳහා 200mg/$Nm^3$ |
| | | | අභ්‍යන්තර දහන එන්ජින් සඳහා 350mg/$Nm^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 75mg/$Nm^3$ |
| නැප්තා | කවර හෝ | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | 75mg/$Nm^3$ |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | හුමාල ටර්බයින සඳහා 350mg/$Nm^3$ |
| | | | වායු ටර්බයින/සංයුක්ත චක්‍ර ටර්බයින සඳහා 250mg/$Nm^3$ |
| | | | අභ්‍යන්තර දහන එන්ජින් සඳහා 400mg/$Nm^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 75mg/$Nm^3$ |
| නාගරික ඝන අපද්‍රව්‍ය | කවර හෝ | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | 70mg/$Nm^3$ |
| | | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 400mg/$Nm^3$ |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/$Nm^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | | කාබන් මෙනොක්සයිඩ් (CO) | 50mg/$Nm^3$ |
| | | හයිඩ්‍රජන් ක්ලෝරයිඩ් (HCI) | 20mg/$Nm^3$ |
| | | රසදිය (Hg) | 0.001mg/$Nm^3$ |
| | | ඊයම් (Pb) | 0.01mg/$Nm^3$ |

*II කොටස*

**පොරොත්තු විදුලි ජනක යන්ත්‍ර**

| *ඉන්ධන වර්ගය* | *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C)* | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* |
|---|---|---|---|
| භූමිතෙල්, පෙට්‍රල් හෝ ඩීසල් දූතෙල් | කවර හෝ | අංශුමය ද්‍රව්‍ය (PM), සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දුම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 10% |

## *III* කොටස

### බොයිලේරු

| *ඉන්ධන වර්ගය* | *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C)* | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* |
|---|---|---|---|
| ඛනිජ තෙල් | C < පැයකට හුමාල මෙට්‍රික් ටොන් 2 | අංශුමය ද්‍රව්‍ය (PM), සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දුම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | C $\geq$ පැයකට හුමාල මෙට්‍රික් ටොන් 2 | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දුම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 15% |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 100mg/$Nm^3$ |
| ජෛව ස්කන්ධ | C < පැයකට හුමාල මෙට්‍රික් ටොන් 2 | අංශුමය ද්‍රව්‍ය (PM), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි දුම්නල උස මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | C $\geq$ පැයකට හුමාල මෙට්‍රික් ටොන් 2 | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි දුම්නල උස මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 15% |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 200mg/$Nm^3$ |
| ගල් අඟුරු | C < පැයකට හුමාල මෙට්‍රික් ටොන් 2 | අංශුමය ද්‍රව්‍ය (PM), සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දුම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | C $\geq$ පැයකට හුමාල මෙට්‍රික් ටොන් 2 | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 500mg/$Nm^3$ |
| | | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), | 850mg/$Nm^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/$Nm^3$ |

### *IV* කොටස

**තාප ද්‍රව ඌෂ්මක**

| *ඉන්ධන වර්ගය* | *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව* (*C*) | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* |
|---|---|---|---|
| ශේෂ තෙල් | C<පැයකට මෙගා ජූල් 5000 | අංශුමය ද්‍රව්‍ය (PM), සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දුම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | C$\geq$පැයකට මෙගා ජූල් 5000 | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දුම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 15% |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 100mg/$Nm^3$ |
| ජෛව ඉන්ධන | C<පැයකට මෙගා ජූල් 5000 | අංශුමය ද්‍රව්‍ය (PM), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි දුම්නල උස මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | C$\geq$පැයකට මෙගා ජූල් 5000 | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි දුම්නල උස මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 15% |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 200mg/$Nm^3$ |
| ගල් අඟුරු | C<පැයකට මෙගා ජූල් 5000 | අංශුමය ද්‍රව්‍ය (PM), සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 11 වන සහ 12 වන නියෝගවල දක්වා ඇති පරිදි දුම්නල උස මගින් සහ ඉන්ධනවල ගුණාත්මක බව මගින් පාලනය කළ යුතු ය. |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | C$\geq$පැයකට මෙගා ජූල් 5000 | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 500mg/$Nm^3$ |
| | | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$), | 800mg/$Nm^3$ |
| | | දුම | පාරාන්ධතාවය 20% |
| | | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/$Nm^3$ |

### *V කොටස*

### දහනාගාර

| *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C)* | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* |
|---|---|---|
| C<පැයකට මෙට්‍රික් ටොන් 1 | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | $70mg/Nm^3$ |
| | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | $400mg/Nm^3$ |
| | අංශුමය ද්‍රව්‍ය (PM), | $150mg/Nm^3$ |
| | දුම | පාරාන්ධතාවය 20% |
| | කාබන් මොනොක්සයිඩ් (CO) | $50mg/Nm^3$ |
| | හයිඩ්‍රජන් ක්ලෝරයිඩ් (HCI) | $20mg/Nm^3$ |
| | රසදිය (Hg) | $0.01mg/Nm^3$ |
| | ඊයම් (Pb) | $0.05mg/Nm^3$ |
| | ඩයොක්සීන් සහ ෆියුරාන් | 14 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි උෂ්ණත්වය සහ ධාරණ කාලය මගින් පාලනය කළ යුතු ය. |
| C≥පැයකට මෙට්‍රික් ටොන් 1 | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | $70mg/Nm^3$ |
| | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | $300mg/Nm^3$ |
| | අංශුමය ද්‍රව්‍ය (PM), | $100mg/Nm^3$ |
| | දුම | පාරාන්ධතාවය 10% |
| | කාබන් මොනොක්සයිඩ් (CO) | $50mg/Nm^3$ |
| | හයිඩ්‍රජන් ක්ලෝරයිඩ් (HCI) | $15mg/Nm^3$ |
| | රසදිය (Hg) | $0.001mg/Nm^3$ |
| | ඊයම් (Pb) | $0.01mg/Nm^3$ |
| | ඩයොක්සීන් සහ ෆියුරාන් | 14 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි උෂ්ණත්වය සහ ධාරණ කාලය මගින් පාලනය කළ යුතු ය. |
| කවර හෝ ව්‍යාධිජනක අපද්‍රව්‍ය දහනාගාර | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | $70mg/Nm^3$ |
| | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | $300mg/Nm^3$ |
| | අංශුමය ද්‍රව්‍ය (PM), | $100mg/Nm^3$ |
| | දුම | පාරාන්ධතාවය 10% |
| | කාබන් මොනොක්සයිඩ් (CO) | $50mg/Nm^3$ |
| | හයිඩ්‍රජන් ක්ලෝරයිඩ් (HCI) | $15mg/Nm^3$ |
| | රසදිය (Hg) | $0.001mg/Nm^3$ |
| | ඊයම් (Pb) | $0.01mg/Nm^3$ |
| | ඩයොක්සීන් සහ ෆියුරාන් | 14 වන නියෝගයෙහි දක්වා ඇති පරිදි උෂ්ණත්වය සහ ධාරණ කාලය මගින් පාලනය කළ යුතු ය. |

*VI කොටස*

**කියුපෝලා, ධාරා ඌෂ්මක, කෝක් උඳුන්, මූලික ඔක්සිජන් දාහක, ප්‍රේරක සහ විද්‍යුත් චාප දාහක**

| *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C)* | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* |
|---|---|---|
| කවර හෝ | අංශුමය ද්‍රව්‍ය (PM), | 150mg/Nm$^3$ |
| | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | 800mg/Nm$^3$ |
| | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 500mg/Nm$^3$ |
| | දුම | පාරාන්ධතාවය 20% |

*VII කොටස*

**සිමෙන්ති පෝරණු**

| *ඇගයූ ප්‍රතිධාන ධාරිතාව (C)* | *දූෂණකාරක වර්ගය* | *විමෝචන සීමාවන්* | |
|---|---|---|---|
| | | *දැනට පවතින** | *නව*** |
| කවර හෝ | අංශුමය ද්‍රව්‍ය (PM), | 400mg/Nm$^3$ | 200mg/Nm$^3$ |
| | සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | 540mg/Nm$^3$ | 270mg/Nm$^3$ |
| | නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 1250mg/Nm$^3$ | 1000mg/Nm$^3$ |
| | දුම | පාරාන්ධතාවය 20% | පාරාන්ධතාවය 20% |

* මෙම නියෝග බලාත්මක වන දිනට පෙර පැවති සිමෙන්ති පෝරණු
** මෙම නියෝග බලාත්මක වන දිනට පසුව ආරම්භ කරන සිමෙන්ති පෝරණු

(3 වන හා 15 වන නියෝග)

*III වන උපලේඛනය*

**දූෂණකාරක ආශ්‍රිත ප්‍රමිතීන්**

I කොටස

| *දූෂණකාරකය* | *ක්‍රියාවලිය/ප්‍රභවය* | *විමෝචන සීමාවන්/ දහනය සහිත* | *විමෝචන සීමාවන්/ දහනය රහිත* |
|---|---|---|---|
| අංශුමය ද්‍රව්‍ය (PM), | කවර හෝ | 150mg/Nm$^3$ | 100mg/Nm$^3$ |
| දුම | කවර හෝ | පාරාන්ධතාවය 25% | පාරාන්ධතාවය 25% |
| කාබන් මෙනොක්සයිඩ් (CO) | කවර හෝ | 900mg/Nm$^3$ | 1100mg/Nm$^3$ |
| සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) | සල්ෆියුරික් අම්ල නිෂ්පාදන කර්මාන්තශාලා | සල්ෆියුරික් අම්ල නිෂ්පාදනය මෙට්‍රික් ටොන් එකක් සඳහා කිලෝ ග්‍රෑම් 2 | |
| | වෙනත් කවර හෝ | 1000mg/Nm$^3$ | 800mg/Nm$^3$ |
| නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | නයිට්‍රික් අම්ල නිෂ්පාදන කර්මාන්තශාලා | නයිට්‍රික් අම්ල නිෂ්පාදනය මෙට්‍රික් ටොන් එකක් සඳහා කිලෝ ග්‍රෑම් 1.5 | |
| | වෙනත් කවර හෝ | 500mg/Nm$^3$ | - |
| සියලුම වාෂ්පශීලී කාබනික ද්‍රව්‍ය (TVOC ) | කවර හෝ | 20ppm | 10ppm |

II කොටස

| *දූෂණකාරකය* | *ක්‍රියාවලිය/ප්‍රභවය* | *විමෝචන සීමාවන්/දහනය සහිත හෝ දහනය රහිත* |
|---|---|---|
| ක්ලෝරීන් ($Cl_2$), | කවර හෝ | ක්ලෝරීන් 35mg/$Nm^3$ |
| හයිඩ්‍රජන් ක්ලෝරයිඩ් (HCI) | හයිඩ්‍රොක්ලෝරික් අම්ල නිෂ්පාදන කර්මාන්තශාලා | හයිඩ්‍රොක්ලෝරික් අම්ල නිෂ්පාදනය මෙට්‍රික් ටොන් එකක් සඳහා කිලෝග්‍රෑම් 0.8 |
| | වෙනත් කවර හෝ | හයිඩ්‍රජන් ක්ලෝරයිඩ් 50mg/$Nm^3$ |
| ෆ්ලෝරීන් ($F_2$) | කවර හෝ | ෆ්ලෝරීන් 20mg/$Nm^3$ |
| ෆ්ලෝරයිඩ් (හයිඩ්‍රජන් හෝ සිලිකන් ($F^-$) | පොස්පේට් ආශ්‍රිත කර්මාන්ත | අමුද්‍රව්‍ය මෙට්‍රික් ටොන් එකක් සඳහා කිලෝග්‍රෑම් 0.18 |
| | වෙනත් කවර හෝ | හයිඩ්‍රජන් ෆ්ලෝරයිඩ් 2mg/$Nm^3$ |
| හයිඩ්‍රජන් සල්ෆයිඩ ($H_2S$) | කවර හෝ | 1mg/$Nm^3$ |
| කැඩ්මියම් හෝ ඒවායේ සංයෝග | කවර හෝ | 1mg/$Nm^3$ කැඩ්මියම් ලෙස |
| ඊයම් හෝ ඒවායේ සංයෝග | ඊයම් උණු කිරීම | 0.2mg/$Nm^3$ ඊයම් ලෙස |
| | වෙනත් කවර හෝ | 0.2mg/$Nm^3$ ඊයම් ලෙස |
| ඇන්ටිමනි හෝ ඒවායේ සංයෝග | කවර හෝ | 0.5mg/$Nm^3$ ඇන්ටිමනි ලෙස |
| ආසනික් හෝ ඒවායේ සංයෝග | කවර හෝ | 0.1mg/$Nm^3$ ආසනික් ලෙස |
| තඹ හෝ ඒවායේ සංයෝග | තඹ උණු කිරීම | 1mg/$Nm^3$ තඹ ලෙස |
| | වෙනත් කවර හෝ | 1mg/$Nm^3$ තඹ ලෙස |
| සින්ක් හෝ ඒවායේ සංයෝග | කවර හෝ | 1mg/$Nm^3$ සින්ක් ලෙස |
| රසදිය හෝ ඒවායේ සංයෝග | කවර හෝ | 0.01mg/$Nm^3$ රසදිය ලෙස |
| ඩයොක්සීන් හෝ ෆියුරාන් | කවර හෝ | 2mg/$Nm^3$ |
| ඇමෝනියා ($NH_3$) | කවර හෝ | 10mg/$Nm^3$ |

(4 වන නියෝගය)

## IV වන උපලේඛනය

### පලායිත අවලම්බිත අංශු (Fugitive Dust Emission) සඳහා විමෝචන ප්‍රමිතීන්

විමෝචනයන් සිදුවන කර්මාන්ත ක්‍රියාවලිය පිහිටි ස්ථානයේ උඩු සුළං දිශාවේ හා යටි සුළං දිශාවේ, සමගාමී පැය තුනක කාලයක් තුළ ලබා ගන්නා ලද මුළු අවලම්බිත අංශු සාන්ද්‍රණ දෙකෙහි වෙනස (භාරමිතික) ඝණ මීටරයට මයික්‍රෝ ග්‍රෑම් 450ට වඩා වැඩි නොවිය යුතු ය.

අ) මැනීම සිදු කරන ස්ථානය කර්මාන්ත ක්‍රියාවලිය පිහිටි ස්ථානයේ විමෝචන සිදුවන ස්ථානයේ සිට උඩු සුළං දිශාවේ සහ යටි සුළං දිශාවේ මීටර් 10ක් ඇතුළත පිහිටා තිබිය යුතු ය.

ආ) මනින කාලය තුළ වැඩි වේලාවක් සුළං හමන දිශාවේ සුළගේ දිශාව ලෙස තීරණය කළ යුතු ය.

ඇ) අධිකාරිය විසින් අනුමත කරන ලද කවර හෝ ක්‍රමයක් මුළු අවලම්බිත අංශු සාන්ද්‍රණ නිර්ණය කිරීම සඳහා යොද ගත යුතු ය.

(4 වන නියෝගය)

## V වන උපලේඛනය

### පලායිත (Fugitive) මීතේන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග සඳහා විමෝචන ප්‍රමිතීන්

පලායිත මීතෙන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග විමෝචනයන් සිදුවන කර්මාන්ත ක්‍රියාවලිය පිහිටි ස්ථානයේ උඩු සුළං දිශාවේ හ යටි සුළං දිශාවේ තෝරාගත් ස්ථානවල එකවර ලබා ගන්නා වායු නියැදි දෙකෙහි මීතේන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග සාන්ද්‍රණයන්ගේ වෙනස 5ppm නොඉක්මවිය යුතු යි.

අ) නියැදි ලබාගන්නා ස්ථාන අදළ කර්මාන්ත ක්‍රියාවලිය පිහිටි ස්ථානයේ සිට උඩු සුළං දිශාවේ හා යටි සුළං දිශාවේ මීටර් 5ක් ඇතුළත විය යුතු ය.

ආ) නියැදි ලබාගන්නා කාලය තුළ වැඩිම වේලාවක් පවතින සුළගේ දිශාව මෙම මිනුම් ලබා ගැනීම සඳහා භාවිතා කළ යුතු සුළගේ දිශාව වේ.

ඇ) අධිකාරිය විසින් අනුමත කරන ලද කවර හෝ ක්‍රමයක් මීතේන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග සාන්ද්‍රණයන් නිර්ණය සඳහා යොද ගත යුතු ය.

(4 වන නියෝගය)

## VI වන උපලේඛනය

### පලායිත (Fugitive) අම්ල දුමාරය සහ පලායිත (Fugitive) ඇමෝනියා දුමාරය සඳහා විමෝචන ප්‍රමිතීන්

කර්මාන්ත ක්‍රියවලියක් හේතුකොටගෙන විමෝචනය වන පලායිත (Fugitive) අම්ල දුමාර හෝ පලායිත (Fugitive) ඇමෝනියා දුමාරයන්ගේ සාන්ද්‍රණය $20mg/m^3$ නොඉක්මවිය යුතු යි. මැනීම සිදු කරන ස්ථානය කර්මාන්ත ක්‍රියාවලිය සිදුවන ස්ථානායට යටි සුළං දිශාවේ මීටර් 5ක් ඇතුළත පිහිටා තිබිය යුතු ය. නියැදි ලබා ගැනීම පැය 03 කාලයක් තුළ විනාඩියකට ලීටර් 01ක වේගයෙන් සිදු කළ යුතු යි. අධිකාරිය විසින් අනුමත කරන ලද කවර හෝ ක්‍රමයක් මෙම මිනුම් සඳහා යොද ගත යුතු ය.

(4 වන නියෝගය)

*VII* වන උපලේඛනය

**ඇස්බැස්ටස් කෙඳි සඳහා විමෝචන ප්‍රමිතීන්**

ඇස්බැස්ටස් කෙඳි යොදා ගනිමින් සිදුකරන කර්මාන්ත ක්‍රියවලියක් හේතුකොටගෙන විමෝචනය වන ඇස්බැස්ටස් කෙඳි ප්‍රමාණය, මිනුම් කළ අගය ඝන මීටරයට කෙඳි 1 නොඉක්මවිය යුතු ය. මිනුම් කරන ස්ථානය කර්මාන්ත ක්‍රියාවලිය සිදුවන ස්ථානයේ සිට යටි සුළං දිශාවේ මීටර් 20ක් ඇතුළත පිහිටා තිබිය යුතු ය. මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද කවර හෝ ක්‍රමයක් මෙම මිනුම් සඳහා යොදා ගත යුතු ය.

(8 වන නියෝගය)

VIII වන උපලේඛනය

**සම්මත ඔක්සිජන් ප්‍රමාණයන්**

| ඉන්ධන වර්ගය | සම්මත ඔක්සිජන ප්‍රමාණය |
|---|---|
| ද්‍රව්‍යමය හා වායුමය ඉන්ධන | 03% |
| ඝණ ඉන්ධන | 06% |

06- 44

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.